

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2022

வருடாந்திர செயல்திறன் அறிக்கை - 2022

ANNUAL PERFORMANCE REPORT – 2022

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

ஸ்ரீலங்கா கோஸ்ட் காவலர் துறை

DEPARTMENT OF SRI LANKA COAST GUARD

වැය ශීර්ෂ 325

தலை எண் 325

HEAD NUMBER 325

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය 325

අන්තර්ගතය		පිටු අංක
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය		
පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	2 - 5
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	5 - 8
පරිච්ඡේදය 03 -	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	9 - 12
පරිච්ඡේදය 04 -	කාර්ය සාධන දර්ශක	13 - 14
පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	15
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	15 - 18
පරිච්ඡේදය 07 -	අනුකූලතා වාර්තාව	19 - 25

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය.....



“සුසැදි සයුරක්” තේමාව කරගනිමින් ශ්‍රී ලංකාද්වීපයේ සාගර කලාපයේ, වෙරළබඩ ප්‍රදේශයේ, දේශීය ජල තීරයේ සහ ගැඹුරු මුහුදේ ආරක්ෂාව සහතික කරමින් ඒකීයත්වය සහ භෞමික අඛන්ඩතාවය පවත්වාගෙන යාමට කැපවී සිටීම ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම රාජකාරීන් වේ.

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සමස්ථ දිවයින ආවරණය වන පරිදි වෙරළ ආරක්ෂක ප්‍රාදේශික හතරක් වශයෙන් පරිපාලනමය පහසුව සඳහා බෙදා වෙන්කොට ඇත. ආයතන, අනුබණ්ඩ, ස්ථානගත කිරීම්, ජීවිතාරක්ෂක පුහුණු පාසල, උසස් පුහුණු පාසල, මුහුදු තීරය ආවරණය වන පරිදි ජීවිතාරක්ෂක මුරකුටි සහ ධීවර පිරික්සුම් මධ්‍යස්ථාන වලින් සමන්විත වන අතර, අධිකාරියට පත් නෞකා හතරක්, වේග ප්‍රහාරක මුර යාත්‍රා දහයක් සහ කුඩා යාත්‍රා මගින් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව දේශීය සමුද්‍රීය කලාපය වෙත ආරක්ෂාව සලසනු ලැබේ.

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවන් සහ වගකීම හඳුනාගෙන ක්‍රියාකල නිසාවෙන්ම මහ සයුරේ සිදුවන නීති විරෝධී මත් ද්‍රව්‍ය ජාවාරම, නීති විරෝධී මසුන් ඇල්ලීම මෙන්ම මුහුදු මංකොල්ල කෙරෙහි අවධානය යොමු කිරීම මගින් එම ජාවාරම් වලක්වා ගැනීමට අත්අඩංගුවට ගැනීම හා නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වටපිටාව ගොඩනගා දෙනු ලබයි. තවද, මුහුදේදී සිදුවන නෞකා හා යාත්‍රා ගිණිගැනීම්, තෙල් විසුරුම් හා තෙල් කාන්දුවීම් වලදී සමුද්‍රීය පාරිසරික පද්ධතිය ආරක්ෂාකර ගැනීමට නිරන්තරයෙන් කැප වී සිටිනු ඇත. ස්වාභාවික විපත් වලදී ආපදාවට ලක්වන ජනතාව මුදා ගැනීම, සහන සැලසීම, ඩෙංගු මර්ධන ක්‍රියාවලිය සඳහා සෘජු දායකත්වය ලබාදීම හා පොදු රාජකාරීන් වලදී දෙපාර්තමේන්තුවක් වශයෙන් ක්‍රියාකාරී කාර්යභාර්යන් ඉටු කිරීම කැපී පෙනේ. දිවයින පුරා විසිරීගිය ජීවිතාරක්ෂක මුරකුටි තුලින් දෙස් විදෙස් සංචාරකයින් වෙත ආරක්ෂාව සලසන අතර, කැස්බෑ පැටවුන් අභිජනනය හා සුමුදීය ජීවීන්ගේ ආරක්ෂාවටද ඉමහත් මෙහෙවරක් සිදුකරමින් ස්වාභාවික පරිසරයද සුරක්ෂිත කරනු ලබයි.

ගෙවීගිය වර්ෂ වලදී ශ්‍රී ලංකාව දේශීය හා විදේශීය වශයෙන් අභියෝග රාශියකට මුහුණ දීමට සිදුවිය. රට සහ ජාතිය මුහුණදෙන අභියෝගාත්මක අවස්ථාවලදී ඊට ශක්තියක් වෙමින් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වගකීම් හඳුනා ගනිමින් ක්‍රියා කර ඇත. කෘෂිකාර්මික, ධීවර කර්මාන්ත හා සේවා යන අංශයන් වෙත වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සෘජු හා වක්‍රලෙස තම සේවය ලබාදී ඇත. මේ ගෙවියන අසීරුම කාල පරිච්ඡේදයේ පවා රට නැවත ගොඩ නැගීමට දරන්නා වූ ප්‍රයත්නයට වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පූර්ණ සහයෝගය ලබාදෙන මොහොතේ දෙපාර්තමේන්තුවේ උන්නතිය උදෙසා තම සේවය ලබා දෙන්නාවූ වෙරළ ආරක්ෂක පුද්ගලයින් සියළුම දෙනාට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව සකස් කිරීමට දායක වූ සියළුම වෙරළ ආරක්ෂක පුද්ගලයින් වෙත මාගේ ස්තුතිය පුදකර සිටිමි.

පී විතාන, යූඑස්පී, එන්ඩීයූ
රියර් අද්මිරාල්
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01.1 පොදු සමාලෝචනය

2009 දෙසැම්බර් මස 09 වන දින ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවේ සම්මත 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක පනත මඟින් මුහුදේදී ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම, ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම, සමුද්‍රීය දූෂණයෙන් සාගර සම්පත් සහ සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම, සුරක්ෂිත සහ සාමකාමී සාගර කලාපයක් ඇති කිරීම යන දැක්ම සහ මෙහෙවර සහතික කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතනයකි. ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපය තුළ නීතිවිරෝධී ක්‍රියාකාරකම්වල නිරතව සිටින නෞකා, යාත්‍රා හා පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සහ ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත සඳහන් පනත මඟින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව බලය ලබාදී ඇත. 2010 මාර්තු මස 03 වන දින නිල වශයෙන් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පසුගිය වසර කිහිපය තුළ සීඝ්‍ර ප්‍රගතියක් ලබා ඇත.

01.2 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර

අ. **දැක්ම**

"සාමකාමී සමුද්‍රීය පරිසරයක් තුළින් ජාතික සුභ සිද්ධිය ආරක්ෂා කිරීම"

ආ. **මෙහෙවර**

සමුද්‍රීය පරිසරයේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, පවිත්‍රතාවය සහතික කිරීම සහ බලාත්මක සමුද්‍ර නීතිය ක්‍රියාත්මක කිරීම, ජෛව විවිධත්ව කළමනාකරණය, ස්වභාවික හා මිනිසා විසින් නිර්මාණය කරනු ලබන ව්‍යවසනයන් කළමනාකරණය සහ ජීවිත හා දේපළ ආරක්ෂක කිරීම වේ.

තවද, සමුද්‍ර පරිසරය සුරක්ෂිත කිරීම තුළින් පරිසරය සමතුලිතතාවය පවත්වා ගැනීම, සමුද්‍ර දූෂණය වැලැක්වීම සහ 'ඇ' සහ 'ඈ' ඡේද යටතේ පහත ඉදිරිපත් කර ඇති කර්තව්‍යන් සහ කාර්යභාරයන් ද ඊට ඇතුලත් වේ.

01.3 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

අ. ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයෙන් පිටතදී සිදුවන නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් කටයුතු වැළැක්වීම.

ආ. ශ්‍රී ලංකාවට අයත් සමුද්‍රීය කලාපයේ සහ දේශීය ජල තීරය තුළ සිදුකරන ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මර්ධනය කිරීම සඳහා නීතිය බලාත්මක කිරීමේ ආයතනයන් සහ සන්නද්ධ හමුදාවන් වෙත සහයෝගය ලබා දීම.

ඇ. ස්වභාවික ව්‍යවසනයන්හිදී විපතට පත්වූ පුද්ගලයන් සෙවීමේ හා ගලවාගැනීමේ රාජකාරී කටයුතු සඳහා දායකත්වය ලබාදීම.

ඈ. ශ්‍රී ලංකා වෙරළ තීරය තුල සිදුවන නීති විරෝධී/ අවිධිමත් සහ වාර්තාගත නොවන මසුන් ඇල්ලීමේ කටයුතු (IUU Fishing) වැලැක්වීම, මුහුදේදී ධීවරයන්ට අවශ්‍ය සහයෝගය ලබා දීම සහ ධීවරයින් ආරක්ෂා කිරීම.

ඉ. සමුද්‍රීය පරිසරය සංරක්ෂණය සහ ආරක්ෂා කිරීම සඳහා දායක වීම.

ඊ. සමුද්‍රීය දූෂණය හා ව්‍යසනයන් වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම මෙන්ම එම කටයුතු නියාමනය කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන වෙත සහයෝගය ලබාදීම.

උ. නීති විරෝධී භාණ්ඩ ජාවාරම් කිරීමට එරෙහිව සහ ආගමනයට එරෙහිව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්යය බලකාය ඇතුළුව අනෙකුත් රාජ්‍ය ආයතනයන් වෙත සහයෝගය ලබා දීම.

ඌ. මුහුදේදී ජීවිත හා දේපළවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම.

එ. සමුද්‍රීය ජීවීන් විශේෂ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා දායක වීම.

ඒ. ස්වභාවික ව්‍යවසනයන්හිදී ගුවන්විදුලි හෝ වෙනත් ක්‍රමවේදයන් මඟින් නිකුත් කරනු ලබන අනතුරු ඇඟවීමේ තත්ත්වයන් පිළිබඳව තොරතුරු ව්‍යාප්ත කිරීමට දායක වීම.

ඔ. රජය විසින් නිකුත් කරනු ලබන නියෝගයන්ට අනුව අනෙකුත් රාජකාරීන් සිදු කිරීම.

ඕ. මුහුදේදී සිදුවන ස්වභාවික ව්‍යවසනයන් සහ මුහුදු අනතුරුවලින් විපතට පත්වන ජීවිත හා දේපළ ගලවා ගැනීමේ කටයුතු සඳහා සහයෝගය ලබාදීම.

01.4 සංවිධාන සටහන

PROPOSED SLCG HEADQUARTERS ORGANIZATIONAL STRUCTURE



4

01.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තුමේන්තු/ දෙපර්තුමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශිය ලේකම් කාර්යාල

භාර දී ඇති කාර්යයන් හා කාර්යයන්වල අනුකූලතාවය සහතික කිරීම මඟින් ශ්‍රී ලංකාවේ සමස්ත වෙරළ තීරය ආවරණය වන පරිදි සිය කඳවුරු, ස්ථාන, උප පොළවල්, ධීවර අධීක්ෂණ ස්ථාන (එෆ්එම්පී) සහ ජීවිතාරක්ෂක ස්ථාන (එල්එස්පී) සහ නාවික ඒකක යොදවා ඇත. තවද, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සුමට ක්‍රියාකාරිත්වය සහ පහසු පරිපාලනය සඳහා, පහත දැක්වෙන පරිදි රටේ සමස්ත වෙරළ තීරය ආවරණය වන පරිදි වෙරළාරක්ෂක කලාප හතරක් ස්ථාපිත කර ඇත:

ඇ. වෙරළාරක්ෂක උතුරු කලාපය.
ආ. වෙරළාරක්ෂක නැගෙනහිර කලාපය.
ඇ. වෙරළාරක්ෂක දකුණු කලාපය.
ඈ. වෙරළාරක්ෂක බටහිර කලාපය.


SLCG DEPLOYMENT
NORTHERN REGION
SLCG HQ
Regional HQ
SLCG Base
SLCG Station
Sub Station
Rear HQ
Life Saving Point (14)
Life Saving Duty Point (02)
Fishing Monitoring P
Special Duty Point
KKS
PPD
Mailadi
Elara
Chalai
Nilaweli
Arippu
EASTERN REGION
Cod Bay
Kalpitiya
Pasikuda
Valachchanei
Chilaw
WESTERN REGION
Thoduwawa
Mahaoya Moya
Wellamunkaru
Nigombo
Dikovita
Oluvill
Welawaththa
Aththidiya
Mt. Laviniya
Dehiwala
Panadura
Egodauyana
Beruwala
Kumbukkan Oya
Benthota
Moragolla
Aluthgama
Bentota
Balapitiya
Ambalangoda
Nilwella
Kirinda
Hikkaduwa
Galle
Unawatuna
Mirissa
Suduwella
Gandara
Dondara
SOUTHERN REGION

01.6 අමාත්‍යාංශය/ දෙපාර්තුමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතනය/ අරමුදල්
නැත

01.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)
නැත

<u>පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම</u>

02.1. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් 2022 වර්ෂය තුළදී සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව එහි සඳහන් ප්‍රමුඛ ක්‍රමෝපායන්වලට අදාළව පහත සඳහන් මෙහෙයුම්/ කාර්යයන් සිදුකරන ලදි.

අ. ජීවිතාරක්ෂක රාජකාරින්

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් 2022 වසර තුළ ජීවිතාරක්ෂක මුරකුටි 16 ක ජීවිතාරක්ෂක මෙහෙයුම් කටයුතු සිදුකරන අතර, 2022 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට 2022 දෙසැම්බර් මස 31 වන දින දක්වා මුහුදේ අනතුරට පත් ජීවිත 173 ක් බේරාගනු ලැබූ අතර, ඉන් 68 ක් විදේශිකයින් විය.

ආ. නීති විරෝධී ක්‍රියා වැළැක්වීම සඳහා සිදුකරනු ලැබූ වෙරළ ආරක්ෂණ මෙහෙයුම්

දිවයින වටා ඇති මුහදු තීරයේ සිදුවන සියළුම නීති විරෝධී ක්‍රියාවන් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි ඇති සියළුම යාත්‍රා යොදවනු ලබන අතර, ඉන් වේග ප්‍රහාරක මුර යාත්‍රා (FPB) 10 ක් සහ වෙරළබඩ මුර යාත්‍රා (IPC) දෙකක් උතුර විධානයට අනුයුක්තව මෙහෙයුම් කටයුතු සිදු කරයි. ඉතිරි මුර යාත්‍රා නැගෙනහිර, වයඹ, බටහිර සහ දකුණේ තෝරාගත් ප්‍රධාන/ ධීවර වරායන්වල රාජකාරින් හි යොදවා ඇති අතර, මිරිස්ස හා කල්පිටිය ප්‍රදේශයන්හි තල්මසුන් නැරඹීමේ කටයුතු සිදුකරන යාත්‍රා නිරීක්ෂණයට ද වෙරළ ආරක්ෂක යාත්‍රා යොදවනු ලබයි.

ඇ. නීති විරෝධී, අක්‍රමවත්, වාර්තා නොවන මසුන් මැරීම් නිරීක්ෂණය

නීති විරෝධී මසුන් ඇල්ලීම සහ මසුන් ඇල්ලීම සම්බන්ධ නීතිවිරෝධී ක්‍රියාකාරකම්,මත්ද්‍රව්‍ය ජාවාරම්, මිනිස් ජාවාරම් හා හොර බඩු ආදිය වැනි නීතිවිරෝධී ක්‍රියාවන් වැළැක්වීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මට සහාය වීම සඳහා දිවයින පුරා පිහිටි ධීවර වරායන් ආවරණය වන පරිදි ධීවර නිරීක්ෂණ ස්ථාන 26 ක් ස්ථාපිත කර ඇත.තවද සියළුම ධීවර යාත්‍රා මහ මුහුදට යාමට පෙර පරීක්ෂාවට ලක් කරනුයේ ධීවර ආඥාපන්න,බෝට්ටු කාර්ය මණ්ඩලය සහ යාත්‍රාවේ ඇති උපකරණවල නීත්‍යානුකූලභාවය සහතික කිරීම සඳහා වන අතර,යාත්‍රා පැමිණෙන විට ද මසුන් ඇල්ලීමේ නීත්‍යානුකූලභාවය සහතික කිරීම සඳහා එම පරීක්ෂණ ක්‍රියාවලියම සිදු කෙරේ.

තවද, ධීවර පිරික්සුම් මධ්‍යස්ථාන රාජකාරි අතරතුර රාජකාරියේ නියුතු ශ්‍රීලංවෙආදෙ නිලධාරීන් මත්ද්‍රව්‍ය සහ නීති විරෝධී ලෙස ධීවර කටයුතු සිදුකරන ලද යාත්‍රා හා පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට සමත් විය.එසේ අත්අඩංගුවට පත් භාණ්ඩ හා පුද්ගලයින් අදාළ ධීවර උපදේශකවරුන් (FIs) හරහා අධිකරණයට නඩු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

ඈ. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

වෙරළ තීරයේ ජීවත්වන ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී වර්ෂය ආරම්භයේ සිට අවසානය දක්වා මුහුදේදී ජීවිත ආරක්ෂාව, සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණය, වෙරළ ආරක්ෂණය, ජීවිත බේරාගැනීම් සම්බන්ධව, වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන්, නීති විරෝධීව මසුන් මැරීම වැළැක්වීම සඳහා ධීවර ප්‍රජාව දැනුවත් කිරීම සහ වෙරළ ආරක්ෂිත කඩොලාන ශාඛ සිටුවීම යන වැඩසටහන් යටතේ ක්‍රමානුකූලව සිදුකරනු ලබයි.

ඉ. සෝදිසි සහ බේරා ගැනීමේ මෙහෙයුම්

මෙම ආයතනය සතුව ඇති සම්පත් උපයෝගි කර ගෙන ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරන සෝදිසි කිරීම් සහ බේරාගැනීම් කටයුතුවලට සහය ලබා දීම සිදු කරන අතර තවද, ශ්‍රී ලංකා පොලීසිය විසින් සහය ඉල්ලා සිටි අවස්ථාවන්හිදී ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමද සිදු කරයි.

ජීවිත ආරක්ෂක මධ්‍යස්ථාන (LIFE SAVING POINT) සහ ධීවර නිරීකෂණ මධ්‍යස්ථාන (FISHING MONITORING POINT) සඳහා සංවෘත පරිපථ රූපවාහිනී (CCTV) පද්ධති සවිකිරීම සහ එම පද්ධති ජාල ගත කිරීම මඟින් සෝදිසි කිරීම් සහ බේරා ගැනීම් පිළිබඳ තොරතුරු සුරක්ෂිතව තබාගැනීමට හැකිවීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු පහසු කර ගැනීමට සහ අදාළ අවස්ථාවන්හිදී භාවිත කිරීමට හැකියාව ලැබී ඇත

ඊ. මුහුදු නීතිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම්

ශ්‍රී ලංකා මුහුදු තීරය තුළ සමුද්‍ර නීතිය ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් සිදු කරනු ලැබූ අතර, අනෙකුත් නීතිය බලාත්මක කිරීමේ සංවිධාන සහ රාජ්‍ය ආයතනවලට නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කරනු ලබයි. තවද, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, නාවික හමුදාව සහ ඉන්දියානු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සමග එක්ව ඉන්දියානු ධීවරයින් පෙරලා සිය රටට යැවීම සහ ශ්‍රී ලාංකික ධීවරයින් නැවත සිය රටට ගෙන්වා ගැනීමේ මෙහෙයුම් සිදු කරනු ලැබේ. 2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා ධීවර යාත්‍රා 01 ක් හා ඉන්දියානු ධීවර යාත්‍රා 04 ක් දෙරට අතර හුවමාරු කිරීම සිදුකරන ලදී.

උ. සමුද්‍රීය පරිසර ආරක්ෂණය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මෙරට තෙල් කාන්දු වීම් පිළිබඳ කටයුතු කරන අතර ශ්‍රී ලංකා මුහුදු තීරයේ සිදුවන තෙල් කාන්දුවීම්වලට ප්‍රතිචාර දැක්වීමට සුදානම්න් සිටී. එබැවින් උතුරු, නැගෙනහිර, දකුණ සහ බටහිර යන වෙරළ ආරක්ෂක කලාප සඳහා තෙල් කාන්දු ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් සුදානම්ව තබා ඇත. තවද මුහුදට ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීම සඳහා ධීවර යාත්‍රාවල රැගෙන යන ප්ලාස්ටික් බෝතල් ප්‍රමාණයම නැවත වරායට ගෙන ඒම පිළිබඳව ශ්‍රීලංවෙආදෙ සහතික කරයි.

තවදුරටත් කැස්බෑ බිත්තර සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ කැස්බෑ පැටවුන් ආරක්ෂා සහිතව මුහුදට මුදාහැරීමේ කටයුතු අඛණ්ඩව සිදුකරන අතර, ඒ අනුව මෙම කාලසීමාව තුළ (2022) කැස්බෑ බිත්තර 18945 ප්‍රමාණයකින් පැටවුන් 9598 ක ප්‍රමාණයක් මුහුදට මුදාහැර ඇත. තවද, පරිසර හිතකාමී වැඩසටහන් යටතේ වෙරළ ආරක්ෂක කදවුරු ආශ්‍රිත මුහුදු තීරයන්වල කඩොලාන ශාක වගාකිරීමේ කටයුතු ද අඛණ්ඩව සිදුකරනු ලබයි.

ඌ. අන්තර්ජාතික සහ කලාපීය සහයෝගිතා වර්ධනය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, අන්තර්ජාතික සහ කලාපීය සහයෝගිත්වය වර්ධනයෙහි ලා එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ ආයතනය (UNODC), ආසියානු වෙරළාරක්ෂක ආයතන නියෝජිතායතන රැස්වීමේ ප්‍රධානියා (HACGAM), ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායනය (JICA), යුරෝපීය සංගමය, ඉන්දියානු සාගර සහයෝගිතා සංගමය (IORA) සමග සම්බන්ධව ජාත්‍යන්තර සහ කලාපීය සහයෝගිතාවය වර්ධනය කිරීම සඳහා කටයුතු කරන ලදි.

තවද, විදේශීය නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමග සම්බන්ධව විවිධ ද්වි පාර්ශික සම්බන්ධතා පවත්වන ලද අතර, ශ්‍රීලංවෙආනෞ සුරක්ෂා 2022 අප්‍රේල් මාසයේදී ඉන්දියාවේ ගෝවා හි ජාතික මට්ටමේ පරිසර දූෂණ ප්‍රතිචාර අභ්‍යාසයටද (NATPOLREX-VIII) සහභාගී විය.

02.2. ගැටළු, අභියෝග සහ මධ්‍ය කාලීන සැලසුම්

අ. ශ්‍රී ලංකාව ආසන්න වශයෙන් කිලෝමීටර 1340 ක් දිගු වෙරළ තීරයක් සහ වර්ග කිලෝමීටර් 21500 ක භෞමික මුහුදු ප්‍රදේශයකින් සමන්විත වේ. එහි මුහුදු නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී මුර සංචාරයක් අවශ්‍ය වන අතර එමගින් මෙම මුහුදු ප්‍රදේශයේ සුරක්ෂිතභාවය සහතික කරයි. ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) සමඟ ඇති කර ගත් ගිවිසුම්වලට අනුව, ශ්‍රී ලංකාවට වෙන් කර ඇති සෙවුම් සහ මුදාගැනීමේ (SAR) කලාපය විශාල මුහුදු ප්‍රදේශයකින් සමන්විත වන අතර, එය භූමි ප්‍රමාණය මෙන් විසි හත් ගුණයකින් විශාලය. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සිය සමුද්‍රීය අභියෝගයන් වන දේශ සීමා ආරක්ෂාව, මත්ද්‍රව්‍ය ජාවාරම, සමුද්‍රීය මුහුදු කොල්ලකෑම් සහ මුහුදේ නීතිවිරෝධී ක්‍රියා, නීතිවිරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ (IUU) මසුන් ඇල්ලීම, නීති විරෝධී සංක්‍රමණ සහ සමුද්‍රීය පරිසර දූෂණය වැනි කටයුතු සාර්ථකව මැඩ පවත්වනු ලැබේ.

ආ. මෙහෙයුම්

සෝදිසි සහ බේරාගැනීමේ කලාපයක් සහිත ආරක්ෂිත මුහුදු ප්‍රදේශයක් සහ පිරිසිදු සාගර පරිසරයක් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් සලකා බැලීමේදී වෙරළාරක්ෂක බලකායේ වර්තමාන අවශ්‍යතා සපුරාලීමට දැනට පවතින වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ වර්තමාන බලඇණිය ප්‍රමාණවත් නොවන බව පෙනීයයි. එබැවින්, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ හි මෙහෙයුම් හැකියාවන් සහ ධාරිතාව වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. තවද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක ආයතන, ස්ථාන, උප ස්ථාන, සහ ජීවිතාරක්ෂක මුරකුටි පිහිටුවීම/ වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. එබැවින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා පහත අත්පත් කර ගැනීමේ/ ප්‍රගති සැලැස්ම ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

S/N	FLEET UNIT/ ESTB	Existing	PROJECTED YEAR					TOTAL
			2023	2024	2025	2026	2027	
01	Off-shore Patrol Vessel (OPV)	02	-	01	-	-	01	**04**
02	Ocean Going Pollution Control Vessel (PCV)	-	-	01	-	-	01	**02**
03	Fast Patrol Boat (FPB)	10	-	01	01	01	01	**14**
04	Inshore Patrol Craft (IPC)	10	-	01	01	01	01	**14**
05	SLCG Bases	02	-	Kirinda, Chilaw	Panadura, Codbay	H'tota	Oluvil	**08**
06	SLCG Station (CGS)	08	-	Nilaweli	-	-	-	**09**
07	SLCG Substation (CGSS)	08	Dodanduwa, Kalamatiya	Mutuwal, Negombo	Delft, Mullativu	Puduwakattu , Nachchikuda	Elankanthei, Gurunagar	**18**
08	Fishing Monitoring Post(FMP)	26	Kapparatota	-	-	-	-	**27**
09	Life Saving Post (LSP)	16	Kirinda, Weligama, Arugambay	Negambo, Preethipura Kalutara	Trinco Town (02)	-	-	**24**

ඇ. NOSCOP (ජාතික තෙල් කාන්දුවීමේ හදිසි සැලැස්ම) අනුව තෙල් කාන්දුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. එසේ වුවත් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සාගරයේ පළමු පෙළ තත්ත්වයකට මුහුණ දීමට සම්පූර්ණයෙන්ම සන්නද්ධ නොවේ. එබැවින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව තෙල් කාන්දුවීම් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව දෙවන මට්ටම දක්වා ඉහළ නැංවීමට අවශ්‍ය තෙල් කාන්දු ප්‍රතිචාර උපකරණ මිලදී ගැනීමට සැලසුම් කර ඇත.

ඈ. පුහුණු කටයුතු

වෘත්තීයමය වශයෙන් රාජකාරි ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහ නාවිකයන්ගේ පුහුණුව අනිවාර්ය වේ. පහත දක්වා ඇත්තේ එම පුහුණු වර්ධන වැඩසටහන්ය.

1. සිවිල් පුද්ගලයින් සඳහා අතරමැදි හා ලෝකඩ පදක්කම් ජීවිතාරක්ෂක පුහුණු පාඨමාලා හඳුන්වාදීම.

2. ශ්‍රීලංවෙඅා දෙපාර්තමේන්තුව සඳහා ජංගම ජීවිතාරක්ෂක පුහුණු කණ්ඩායමක් පිහිටුවීම.

3. විදේශ රටවල් සමඟ සහයෝගිතාවයෙන් වැඩි දේශීය පුහුණු අවස්ථා ලබාදීම.

ඉ. තාක්ෂණික

1. චීන මහජන හමුදා ප්‍රදාන වැඩසටහන යටතේ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති VHF සංඥා යන්ත්‍ර 10ක්, UHF සංඥා යන්ත්‍ර 05ක් සහ VHF අත් සංඥා යන්ත්‍ර 35ක් මේ වන විටත් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලැබී ඇති අතර එම සංඥා යන්ත්‍ර වැඩසටහන්කරණය (Programmeing) කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබාදීමට කටයුතු සැලසුම් කර ඇත. තවද මෙම සන්නිවේදන උපකරණ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා නාවික හමුදාව අතර වූ මෙහෙයුම් මධ්‍යස්ථාන, රේඩාර් මධ්‍යස්ථානයන් සහ නෞකා හා යාත්‍රාවන් සඳහා විශේෂ සන්නිවේදන ක්‍රමවේදයක් ලෙස භාවිත කිරීමට නියමිතව ඇත. තවද ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් අනුබණ්ඩ වෙතින් වඩාත් ඵලදායී සේවාවක් ලබාගැනීම සඳහා එම ස්ථාන වෙත දුරකථන හා අන්තර්ජාල පහසුකම් සහිත CDMA දුරකථන ලබාදී ඇත.

2. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථානයේ නව පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමත් සමග වැඩිවන ලද විදුලිබල අවශ්‍යතාවය සපුරාලීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථාන පරිශ්‍රයේ දැනට පවතින විදුලි ට්‍රාන්ස්ෆෝමරයේ ධාරිතාව 250kVA දක්වා වැඩි කිරීමේ කටයුතු මේ වන විටත් සිදු කෙරෙමින් පවතී. තවද හදිසි විදුලි බිඳවැටීමකදී භාවිත කිරීම සඳහා 250kVA විදුලි ජනක යන්ත්‍රයක් ඇණවුම් කිරීමේ කටයුතු ද මේ වන විට සැලසුම් කර ඇත.

3. ඕස්ට්‍රේලියානු රජයේ මගින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ප්‍රදානයක් ලෙස බ්‍රෝන යානා 12ක් ලැබී ඇති අතර ඒවා වෙරළතීරය නිරීක්ෂණ සහ වෙනත් විශේෂිත අවස්ථාවන් නිරීක්ෂණ සඳහා යොදාගැනීමට නියමිත අතර නව රේඩාර් සහ විද්‍යුත් දෘශ්‍ය උපාංග යොදාගනිමින් සමුද්‍රීය නිරීක්ෂණ කටයුතු සඳහා වූ හැකියාව වැඩිදියුණු කිරීමට ද සැලසුම් කර ඇත.

4. වැඩිවන විදුලිබල ඉල්ලුමට සාපේක්ෂව ශ්‍රී ලංකා වෙරළආරක්ෂක වරුණ ආයතනය වෙත විදුලිබල මණ්ඩලය වෙතින් දැනට ලබාගෙන ඇති විදුලි සම්බන්ධතාවය 100kVAක තොග සැපයුම් සම්බන්ධතාව දක්වා වැඩි කිරීමට කටයුතු කරමින් පවතී.

.....

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

<u>පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය</u>

03.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිජ්-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022		සටහන	තක්සා නැවත ඉදලපන ලද 2022	2021	
රු.			රු.	රු.	
	ආදායම් ලැබීම්		-	-	
0	ආදායම් බදු	1	-	-	
0	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිජ්-1
0	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
0	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
0	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
0	ආදායම් නොවන ලැබීම්		-	-	
0	භාණ්ඩාගාර අග්‍රිම		315,256,000	276,778,000	ඒසිජ්-3
0	තැන්පතු		3,486,254	19,625	ඒසිජ්-4
0	අක්තිකාරම් ගිණුම්		-	-	ඒසිජ්-5
0	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		23,603,082	11,985,003	
0	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		342,345,335	288,782,628	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		342,345,335	288,782,628	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		22,991,500	-	
0	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		319,353,835	288,782,628	
	අඩු කළා : වියදම්				
0	පුනරාවර්තන වියදම්				
250,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	139,630	129,368	
65,350,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	62,997,609	70,185,098	ඒසිජ්-2(ii)
0	ගහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	-	
0	පොළී ගෙවීම්	8	-	-	
0	වෙනත් පුනරාවර්තන වියදම්	9	44,496	8,000	
65,600,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		63,181,736	70,322,466	
	මූලධන වියදම්				
273,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	111,245,504	117,049,403	
163,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	157,609,165	108,872,834	
0	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිජ්-2(ii)
0	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
5,000,000	හැකියා වර්ධනය	14	4,734,350	16,040,968	
0	වෙනත් මූලධන වියදම්	15	-	-	
441,000,000	මුළු මූලධන වියදම් (උ)		273,589,018	241,963,205	
	තැන්පතු ගෙවීම්		18,400	78,918	ඒසිජ්-4
	අක්තිකාරම් ගෙවීම්		-	-	ඒසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (උෆ)		18,400	78,918	
	මුළු වියදම් එ = (ඊ+උ+උෆ)		336,789,154	312,364,589	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(17,435,319)	(23,581,961)	
	අග්‍රිම නැතුම් ප්‍රකාශය අනුව ශේෂය		17,435,319	23,581,961	ඒසිජ්-7
506,600,000	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිජ්-3

03.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	2,338,652,678	2,181,043,514
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	-	
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	
මුළු වත්කම්		2,338,652,678	2,181,043,514
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(3,477,679)	(9,825)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,338,652,678	2,181,043,514
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4		
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	3,477,679	9,825
මුළු වගකීම්		-	-
		2,338,652,678	2,181,043,514

පිටු අංක....7....සිට ...32... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ...33... සිට ...34... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	~~ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි~~
නම : 27/2/2023	නම :	~~අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)~~
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය : 2023.02.19	දිනය : 2023.02.19

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
වම්බඩම්පි ආර්ඩම්පි ආර්ඩස්පි යූඑස්පි එන්ඩියු පීඑස්සී එම්පිල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන කාර්යාලය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

පී විතාන, යූඑස්පී, එන්ඩියු
රියර් අද්මිරාල්
අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රීලංවේදාදෙ

KL NISHANTHI
Accountant
Sri Lanka Coast Guard

03.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

එසිජ්-සි

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022 රු.	නැවත ඇලපන ලද 2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	23,603,082	12,838,896
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	315,256,000	276,778,000
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
තැන්පතු ලැබීම්	3,486,254	19,625
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**342,345,335**	**289,636,521**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	63,181,736	69,758,213
සහනාධාර සහ මාරුකිරීම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	-	-
අත්තිකාරම් ගෙවීම්	-	
තැන්පතු ගෙවීම්	18,400	78,918
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**63,200,136**	**69,837,131**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**279,145,200**	**219,799,390**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	
උපණය අයකර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	273,589,018	218,945,497
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**273,589,018**	**218,945,497**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(273,589,018)**	**(218,945,497)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**5,556,181**	**853,893**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්	-	-
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**5,556,181**	**853,893**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	

03.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුව % ලෙස
නැත	නැත	නැත	නැත	නැත	නැත

03.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තක්‍ෂ වියදම්	උපයෝගී කරනුලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	65,600,000.00	65,600,000.00	63,181,736.00	96.31
ප්‍රාග්ධන	441,000,000.00	441,000,000.00	273,589,018.00	62.04

03.7 මු.රෙ 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තක්‍ෂ වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත

03.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	295,276,025.70	300,045,695.89	-	1.62
9152	යන්ත්‍රෝපකරණ	154,607,993.69	165,393,410.97	-	6.98
9153	ඉඩම්	1,640,028,000.00	1,640,028,000.00	-	0.00
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	91,107,923.50	233,185,571.00	-	155.94
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

03.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම ලෙස ඉදිරිපත් කෙරේ.

<u>පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක</u>

04.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තක්ෂ (%) නිමැවුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
වැටුප් හා වේතන - 1001 අ. වැ.බ ගණකාධිකාරීගේ වැටුප් ගෙවීම/ ආ. දෙපාර්තමේන්තු මිලදී ගැනීමේ කමිටු සාමාජිකයින් වෙත ගෙවීම් කිරීම.	93.10		
දේශීය ගමන් වියදම් - 1101 රාජකාරී ගමන් සඳහා අධිවේගී මාර්ගය භාවිත කිරීම වෙනුවෙන් වියදම් පියවීම.		83.96	
ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ - 1201 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ලිපි ද්‍රව්‍ය අවශ්‍යතාවය මිළදී ගැනීම සම්බන්ධයෙන් වන බිල්පත් ගෙවීම සඳහා සමුපූර්ණ මුදල වෙන් කර ඇත.	99.73		
ඉන්ධන - 1202 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත වාහන සඳහා නාවික හමුදාව වෙතින් ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත .			
ආහාර හා නිළ ඇඳුම් - 1203 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත පුද්ගලයින්ට නිළ ඇඳුම් ලබා දීම සම්බන්ධයෙන් වන බිල්පත් ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත.	99.94		
වෙනත් - 1205 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි කටයුතු කරගෙන යාමට අවශ්‍ය වන පොදු ගබඩා විෂයයන් මිළදී ගැනීම වෙනුවෙන් වන බිල්පත් ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත.	92.47		
වාහන නඩත්තු වියදම් - 1301 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත වාහනවල සුළු අළුත්වැඩියාවන් සහ සේවාවන් කිරීම සම්බන්ධයෙන් වන බිල්පත් ගෙවීම් කිරීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත.	99.30		
යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ නඩත්තු - 1302 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් විදුලිජනක යන්ත්‍ර, පිටත දහන යන්ත්‍ර හා වායු සමීකරණ යන්ත්‍රවල අළුත්වැඩියාවන් සහ සේවාවන් සිදු කිරීම සම්බන්ධයෙන් වන බිල්පත් ගෙවීම් කිරීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත.	93.43		
ගොඩනැගිලි සහ ඉදිකිරීම් - 1303 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි සහ ඉදිකිරීම්වල නඩත්තු කටයුතු සඳහා වන වියදම් වෙනුවෙන් සම්පූර්ණ මුදල වෙන් කරන ලදි.	90.92		
ප්‍රවාහන කුලී - 1401 සුදුසු වාහන කුලී පදනම මත ලබා ගැනීම සහ ගලි බවුසර් සහ චතුර බවුසර් කුලී පදනම මත ලබා ගැනීම සම්බන්ධයෙන් වන බිල්පත් නිරවුල් කිරීම	98.60		
තැපැල් ගාස්තු හා සන්නිවේදන - 1402 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දුරකථන සහ තැපැල් ගාස්තු සඳහා ගෙවීම් කිරීමට සම්පූර්ණ මුදල වෙන් කර ඇත.	94.97		
විදුලිය හා ජලය - 1403 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි විදුලි හා ජල බිල්පත් සඳහා ගෙවීම් කිරීමට සම්පූර්ණ මුදල වෙන් කර ඇත.	99.99		

බදු කුලී - 1404 ශ්‍රීලංවෙආ වරුණ සහ ඔළුවිල් යන ආයතන පිහිටා ඇති ඉඩම් සඳහා රජයේ බදු ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත.			66.11
වෙනත් - 1409 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අනෙකුත් වියදම් සඳහා සම්පූර්ණ මුදල පොදු සේවාවන් වෙනුවෙන් වූ වෙන් කරන ලදී	99.57		
ගොඩනැගිලි හා සැකසුම් - 2001 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි පුනරුත්තාපනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා වන වියදම් සඳහා සම්පූර්ණ මුදල වෙන් කරන ලදී	95.31		
යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ - 2002 ශ්‍රීලංවෙආනෞ සුරක්ෂා නෞකාවේ සහ අනෙකුත් වෙරළ ආරක්ෂක නෞකා සහ යාත්‍රාවල පහත සඳහන් අළුත්වැඩියාවන්ට අදාල බිල්පත් ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත. අ. යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාවන් ආ. වියලි නැව් තඹකාංගනයට ගෙන සිදු කරනු ලබන අළුත්වැඩියාවන්.			
වාහන - 2003 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු වාහනවල ප්‍රධාන අළුත්වැඩියාවන් වන ටින්කරින් කිරීම, පින්තාරු කිරීම සහ අනෙකුත් ප්‍රධාන අළුත්වැඩියාවන් වෙනුවෙන් වන බිල්පත් ගෙවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත.	99.02		
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ - 2102 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු රාජකාරීන් සිදු කිරීම සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිළදී ගැනීම සඳහා වන වියදම් පියවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත.	98.64		
යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ - 2103 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි නෞකා සහ යාත්‍රා, ආයතනවලට අවශ්‍ය යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම සඳහා වන බිල්පත් පියවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත.	97.83		
ගොඩනැගිලි සහ ඉදි කිරීම - 2104 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සහ ඉදි කිරීම සඳහා වන වියදම් පියවීම සඳහා වන සම්පූර්ණ මුදල වෙන් කර ඇති වියදම් පියවීම. අ. වෙරළ ආරක්ෂක ස්ථානගතකිරීම් කිරින්දහි ජ්‍යෙෂ්ඨ නිලධාරි නිවසනයේ නාන කාමරය, කණිෂ්ඨ නාවිකයින්ගේ නිවස්නය අවි ,ගබඩාව සහ අපජලය කළමනාකරණ පද්ධතිය. ආ. ශ්‍රීලංවෙආ රෝහණ කාර්යවර්ධන ශාලාව. ඇ. ශ්‍රීලංවෙආ වරුණ නිලධාරි නිවාසයේ අමතර කාමර දෙකක් ඉදිකිරිම. ඈ. වෙරළ ආරක්ෂක ස්ථානගතකිරීම් හලාවතහි ආරක්ෂක වැට අළුත්වැඩියාව. ඉ. වෙරළ ආරක්ෂක ස්ථානගතකිරීම් දෙහිවල රේඩාර් මධ්‍යස්ථානය නවීකරණය කිරිම.		81.86	
පුහුණු කිරීම් හා හැකියාවන් වර්ධනය කිරීම - 2401 වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පුද්ගලයින්ගේ දැනුම සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු පාඨමාලාවන් ලබා ගැනීම සඳහාත්, දෙපාර්තමේන්තුවේ පුහුණු පහසුකම් වර්ධනය කිරීම සඳහාත් වන වියදම් පියවීම සඳහා සම්පූර්ණ මුදල වෙන් කර ඇත.	94.69		

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

05.1. තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්ක/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
ක්‍රියාත්මක කර නැත	-	-	-	-	-

05.2. තිරසාර සංවර්ධන ව්‍යාපෘති දැනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක නොවන බැවින් ඉලක්ක සපුරා ගැනීම හෝ අභියෝග පිළිබඳ කොරතුරු නොමැත.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැකිකඩ

අඅ.	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම.
				දේශීය	විදේශීය		
1	එක්සත් ජනපද වෙරළ ආරක්ෂක ඇකඩමිය (USCGA Class 2025)	1	4YEARS W.E.F 22.06.2021		246,036.00	ඇමෙරිකාව	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
2	(BARRACUDA) අභ්‍යාසය	2	10.01.2022 14.01.2022		152,250.00	පාකිස්තානය	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
3	IMO LEVEL I & II නිලධාරි පාඨමාලාව	2	17.04.2022 01.05.2022		310,080.00	ඉන්දියා	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
4	IMO LEVEL I නාවිකයන් පාඨමාලාව	2	17.04.2022 25.04.2022		155,040.00	ඉන්දියා	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
5	ඉන්දියානු වෙරළාරක්ෂක බලකායේ 08 වන NATPOLREX සහ සමුද්‍ර දූෂණ වැඩමුළුව සහභාගී වීම	1	18.04.2022 22.04.2022		122,336.25	ඉන්දියා	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
6	MRCC & SAR නිලධාරි සහ නාවික පාඨමාලාව	4	23.05.2022 28.05.2022		369,600.00	ඉන්දියා	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
7	අග්නිදිග ආසියා සහයෝගිතා සහ පුහුණු (SEACAT) 2022, අවසන් සැලසුම් සම්මන්ත්‍රණය සිංගප්පූරුව .	2	28.06.2022 29.06.2022		118,368.00	සිංගප්පූරුව	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
8	සෙවීම අල්ලා ගැනීමේ උපදේශක පුහුණුව (VBSS)	1	30.07.2022 30.09.2022		244,398.00	බංග්ලාදේශය	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
9	VBSS මූලික කණ්ඩායම් පාඨමාලාව සහ බෝඩිං කාණ්ඩායම් පාඨමාලාව	2	31.07.2022 11.08.2022		443,220.00	බංගලාදේශය	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
10	ඉංදු පැසිෆික් පරිසර ආරකෂණ සංසදය (IPESF)	1	01.08.2022 04.08.2022		76,331.00	මාලදිවඉන	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
11	UNODC-සාගරික වසම් දැනුවත් කිරීමේ වැඩසටහන	1	02.08.2022 11.08.2022		105,905.80	පිලිපිනය	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම

12	IFC-IOR වෙත හුවමාරු සංචාරය	1	04.08.2022 05.08.2022		44,880.36	ඉන්දියා	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
13	බංග්ලාදේශයේ සමුද්‍රීය ආධාර සහ සෙවීම් සහ මුදාගැනීමේ පාඨමාලාව පිළිබඳ IORA වැඩමුළුව	1	05.09.2022 08.09.2022		89,016.00	බංගලාදේශය	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
14	බෙංගාල බොක්කෙහි සමුද්‍ර ආරක්ෂක සහයෝගිතාව පිළිබඳ Bimstec විශේෂඥ කණ්ඩායමේ පළමු රැස්වීම ඉන්දියාවේදී එකඟතාව අපේක්ෂා කිරීම	1	06.09.2022		44953.08	ඉන්දියා	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
15	අග්නිදිග ආසියාවේ සහයෝගිතා සහ පුහුණු අභ්‍යාස 2022 (SEACAT)	2	15.09.2022 26.09.2022		227,883.04	සිංගප්පුරුව	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
16	SAR, සමුද්‍රීය ආපදා වැළැක්වීම සහ සමුද්‍ර පරිසර ආරක්ෂණ පාඨමාලාව	1	23.09.2022 05.11.2022		244,160.40	ජපානය	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
17	(MSC) මාස්ටර් උපාධි 2022-2023	1	25.09.2022 15.09.2023		244,794.00	ජපානය	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
18	සමුද්‍රීය නීතිය බලාත්මක කිරීමේ පාඨමාලාව	1	30.09.2022 09.11.2022		122,397.00	ජපානය	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
19	බාලි ක්‍රියාවලියේ වට මේසයේ ප්‍රාදේශිය සහාය කාර්යාලයට(RSO) ආරධනය -අවිධිමත් සංක්‍රමයන පිලිබඳ නිර්මාණකත්ම සංවාදය පුද්ලයන් ජාවාරම් කිරීම සහ පුද්ගලිකව ප්‍රවාහනය කිරීම	1	31.10.2022 04.11.2022		49,354.80	තයිලන්තය	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
20	සමුද්‍රීය වසම් දැනුවත් කිරීම (MDA)	1	07.11.2022 18.11.2022		98,709.60	මැලේසියාව	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
21	සෝදිසි කිරීම හා මුදවා ගැනීම පිළිබඳ පාඨමාලාව	4	13.11.2022 24.11.2022		886,440.00	මාලදිවඉන	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
22	දකුණු ඉන්දියානු සාගරයේ ප්‍රංශ විදේශීය ප්‍රදේශයක් වන Reunion Island වෙත පිවිසෙන්	1	14.11.2022 16.11.2022		105,795.48	ප්‍රංශය	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
23	UNODC ධිවර යාත්‍රා බෝඩිං මෙහෙයුම් (FVBO) පාඨමාලාව	4	27.11.2022 08.12.2022		460,496.96	මාලදිවඉන	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම
24	වෙරළ ආරක්ෂක සමුළුව (COSC)	1	30.11.2022 02.12.2022		24,669.48	ඉන්දියා	වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරි දැනුම

06.1. සේවක සංඛ්‍යා කළමණාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු (අතිරික්ත) /
නිලධාරීන්	125	108	17
නාවිකයින්	1500	1347	153

06.2. වර්ථමානයේ ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පුද්ගල අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම සපුරාලනු ලබන්නේ ශ්‍රී ලංකා නාවික හමුදාව විසිනි. මෙහිදී ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සතු මෙහෙයුම් රාජකාරි ඉටු කිරීම සඳහා ඉහත සඳහන් පරිදි අනුමත සේවක සංඛ්‍යාවක් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ලබා ගැනීමට අනුමත කර ඇති අතර ඉන් ඉහත පරිදි සේවක හිඟයක් සහිතව ලබාදී ඇති සේවක සංඛ්‍යාව මඟින් දැනට දුෂ්කරතාවයන් සහිතව වෙරළ ආරක්ෂක රාජකාරි ඉටුකරනු ලබයි.

06.3. මාවන සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජන (000.රු)		වැඩසටහනේ ස්වභාවය (විදේශීය/දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
වෙරළ ආරක්ෂක රාජකාරි හඳුන්වාදීමේ පාඨමාලාව	102	දින 10 යි	-	-	දේශීය	ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය පිළිබඳ දැනුම.
සෝදිසි කිරීම් හා මුදවා ගැනීම් පිළිබඳ පාඨමාලාව	102	දින 05 යි	-	-	දේශීය	යාත්‍රා පරීක්ෂා කිරීමේ හැකියාව ලබා ගැනීම
සමුද්‍රීය නීති බලාත්මක කිරීම පිළිබඳ පාඨමාලාව සහ සමුද්‍රීය යාත්‍රා පරීක්ෂා කිරීමේ නිලධාරි පාඨමාලාව	102	දින 05 යි	-	-	දේශීය	මුහුදේ ගොඩබිම සම්බන්ධ රාජකාරි ඉටු කිරීමේ හැකියාව
යාත්‍රා සෙවීම සහ අත්පත් කරගැනීමේ පාඨමාලාව	102	දින 12 යි			දේශීය	මුහුදේදී නෞකාවලට ගොඩවී ආදාළ රජකාරි කිරීමේ හැකියාව
තෙල් කාන්දුවීම් පිළිබඳ සුදානම් වීමේ හා ප්‍රතික්‍රියා මාර්ග පිළිබඳ පාඨමාලාව	102	දින 10 යි			දේශීය	තෙල් විසිරීමක් සිදුවූ විටදි එය තවදුරත් විසිරීම වළක්වා තෙල් ඉවත් කිරීමේ හැකියාව
මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය විසින් පවත්වනු ලැබූ - පැමිණීම, ගොඩවීම, සෙවීම සහ අල්ලා ගැනීම උසස් පාඨමාලාව	35	දින 12 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
RHIB යාත්‍රා හැසිරවීම සහ ජලතරණ පාඨමාලාව	14	දින 05 යි			දේශීය	RHIB කුඩා යාත්‍රා හැසිරවීමේ දැනුම
RHIB යාත්‍රා හැසිරවීමේ පාඨමාලාව	102	දින 05 යි			දේශීය	RHIB කුඩා යාත්‍රා හැසිරවීමේ දැනුම
මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය විසින් පවත්වනු ලැබූ - ලෝක අභිරුචි සංවිධාන (WCO) බහාලුම් පාලන වැඩසටහන (CCP)	09	දින03 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
සමුද්‍රීය වසම පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම සඳහා පුළුල් ප්‍රවේශයන් (MDA) හැකියාවන්	25	දින 04 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
පළමු ජාත්‍යන්තර සමුළුව මත සමුද්‍රීය සහ සමුද්‍ර අපරාධ විමර්ශන : මුහුදේ අධිකරණ	07	දින 03 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම

වෛද්‍ය විද්‍යාව						
එක් දින වැඩමුළුවක් " ජාතික ආරක්ෂාව සඳහා මතුවන රසායනික තර්ජන "	07	දින 01 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
ජාතික පුහුණු පාඨමාලාව “සකස් කිරීම, න්‍යෂ්ටික හෝ විකිරණ හදිසි අභ්‍යාස පැවැත්වීම සහ ඇගයීම” සමඟ සහයෝගයෙන් IAEA	01	දින 05 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
පැසිෆික් විධාන .ජ.ඉන්දු - (INDOPACOM) පාරිසරික ආරක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්පත් නිලධාරීන් නිසින් මෙහෙයවන ලද තෙල් කාන්දු ප්‍රතිචාර වැඩමුළුව සහ අභ්‍යාස	12	දින 05 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ (IORA) ක්‍රියාකාරී කණ්ඩායමේ සමාරම්භක පළමු රැස්වීම (WGDRM)	03	දින 02 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
මුහුදු දැක්ම නිලධාරී පාඨමාලාව	04	දින 05 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
ඕස්ට්‍රේලියානු දේශසීමා බලකාය - බුද්ධි සංකල්ප පුහුණුව	24	දින 03 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
EU අරමුදල් සහිත ව්‍යාපෘතිය CRIMARIO II මූලික IORIS විස්තර - හුවමාරු පාඨමාලාව	05	දින 05 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය විසින් පවත්වනු ලැබූ Table Top අභ්‍යාසය	03	දින 03 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය විසින් පවත්වනු ලැබූ - ධීවර යාත්‍රා ගොඩකිරීමේ මෙහෙයුම් (FVBO) පාඨමාලාව	05	දින 12 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
එජ. මුහුදු දැක්ම පුහුණුකරු පාඨමාලාව	05	දින 05 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
පැමිණීම, ගොඩවීම, සෙවීම සහ අල්ලා ගැනීම පෙර නිරූපණය සඳහා CARAT අභ්‍යාසය	04	දින 05 යි			දේශීය	වෙරළාරක්ෂක රාජකාරි පිළිබඳ දැනුම
මූලික ජීවිතාරක්ෂක මූලික පුහුණු පාඨමාලාව	41	දින 07 යි			දේශීය	ජීවිතාරක්ෂක රාජකාරි සිදුකිරීමේ හැකියාව
ජීවිතාරක්ෂක අතරමැදි පාඨමාලාව	07	දින 12 යි			දේශීය	ජීවිතාරක්ෂක රාජකාරි සිදුකිරීමේ හැකියාව
ජීවිතාරක්ෂක ලෝකඩ පදක්කම් පාඨමාලාව	23	දින 12 යි			දේශීය	ජීවිතාරක්ෂක රාජකාරි සිදුකිරීමේ හැකියාව
ජීවිතාරක්ෂක උපදේශක පුහුණු පාඨමාලව ශ්‍රීලංවෙඅදෙ සඳහා	31	දින 05 යි			දේශීය	ජීවිතාරක්ෂක රාජකාරි සිදුකිරීමේ හැකියාව
ජීවිතාරක්ෂක තථාක ගාඩ් පුහුණු පාඨමාලව ශ්‍රීලංවෙඅදෙ සඳහා	22	දින 04 යි			දේශීය	ජීවිතාරක්ෂක රාජකාරි සිදුකිරීමේ හැකියාව
මූලික ඉරියව් පුහුණු පාඨමාලාව ශ්‍රීලංවෙඅදෙ සඳහා	73	දින 05 යි			දේශීය	ජීවිතාරක්ෂක රාජකාරි සිදුකිරීමේ හැකියාව

<u>පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව</u>

අනු. අං.	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය / අනුකූලවේ) අනුකූල (නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා පැහැදිලි කිරීම	අනුකූළ නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ ගිණුම් / නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත නාවික හමුදාව වෙතින් ද්විතීක පදනම මත කාර්මණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් එවැනි ගිණුමක් පවත්වාගෙන යනු නොලැබේ.	
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වානිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ	වෙආදෙ විසින් ව්‍යාපාර හා නිෂ්පාදන කටයුතු සිදු කරනු නොලබයි.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	වෙආදෙ තුළ එවැනි ගිණුමක් පවත්වාගෙන යනු නොලබයි.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	වෙආදෙ තුළ එවැනි ගිණුමක් පවත්වාගෙන යනු නොලබයි.	
1.6	වෙනත්	නැත		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ 445 අනුව)	අනුකූලවේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වත්කම් අනුව ස්ථාවර 2018/267/ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන පුද්ගල / පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ	වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත නාවික හමුදාව වෙතින් ද්විතීක පදනම මත කාර්මණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් ඔවුන්ගේ පඩි නඩි නාවික හමුදාව වෙතින්ම ගෙවනු ලබයි.	
2.3	විගණන විමසුම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූලවේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූලවේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ CIGAS පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැර කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය) GA - N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (135 .රෙ.මූ)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී නිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර නිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී නිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදි ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අදාළ නොවේ	ද්විතීක පදනම් මත නාවික හමුදාව වෙතින් කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් වැටුප් සැකසීමක් සිදුනොවේ.	
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාන්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නිබීම	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණනකාධිපතිවරය විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නිබීම.	අනුකූල වේ.		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මූ රෙ.134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී	අනුකූල වේ	.	

	විගණනකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උපවගන්තිය ප්‍රකාරවසියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දේපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල නොවේ	2022 වර්ෂයේ ප්‍රථම කාර්තුවට අදාළව 2022.06.30 වන දින කළමනාකරණ කමිටු රැස්වීම පවත්වන ලදී.තවද 2022.08.22 දින අභ්‍යන්තර විගණන පරීක්ෂණ පිළිබඳ කමිටු රැස්වීමක් පවත්වන ලදි.	
8	වත්කම් කළමනාකරනය			
8.1	01/2017අංක දරන වත්කම් කළමණාකරන චක්‍ර ලේඛනයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීමේ හා අපහරණය කිරීම ලඒ පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝ ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධ විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/05 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්ථා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	චක්‍රලේඛය අනුව 2021 ජුනි මස 15 වන දිනට ප්‍රථම ඉදිරිපත් කිරීමට නියමිතව ඇත	
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල නොවේ	චක්‍රලේඛය අනුව 2021 අප්‍රේල් මස 15 වන දිනට ප්‍රථම ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම	අනුකූල		

	මු.රෙ. 772 අනුව සිදු කිරීම	නොවේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්ථා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස කට වඩා 06 අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු ,104 ,103 රෙ. කාරව කටයුතු කිරීමපු 110 සහ 109	අනුකූල වේ		
9.5	2016.12.29 වන දිනැති අංක පරිපාලන දරණ රාජ්‍ය 30/2016 ඡේදයේ සඳහන් 3.1 ලේඛයේවක්‍ර විධි විධානප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය	අනුකූල වේ		
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කිරීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා සැලසුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය	අනුකූල වේ		
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94 (1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	ද්විතීක පදනම මත නාවික හමුදාව වෙතින් කාර්‍යමණ්ඩලය අනුයුක්ත කර ඇති බැවින් වෙආදෙ වෙතින් ණය ලබා දීමක් සිදුනොකරයි.	
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූලවේ		

12.2	හිග හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අදාළ නොවේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කිරීම	අදාළ නොවේ		
13	පොදු තැන්පත් ගිණුම	අනුකූල වේ		
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම	අනුකූල වේ		
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල්පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම්	මෙම දෙපාර්තමේන්තුව ආදායම් උපයන ආයතනයක් නොවන බැවින් අදායම් ගිණුම් පවත්වාගෙන යාමක් සිදු නොකෙරේ.		
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු , ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම.	අදාළ නොවේ		
15.3	මු 176 .රෙ.අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	මානව සම්පත් කළමනාකරණය	අනුකූලවේ		
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලවේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම	අනුකූලවේ		

	වාර්තා කළමනාකරණ සේවා දොපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම			
17	මහජනයා වෙත තොරතුරු ලබාදීම			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳව මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලවේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	2022 වර්ෂයට අදාළව තොරතුරු ඉල්ලීම් නොමැත	
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක (1) 2018/05 හා 2008/05 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	මෙතෙක් සම්පාදනය කර නොමැත	ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය
18.2	එම චක්‍රලේඛයේ ඡේදය පරිදි 2.3 පුරවැසි /ඥප්තියසේවාලාභී ප්‍ර සම්පාදනය කිරීම හාක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම	අනුකූල නොවේ	මෙතෙක් සම්පාදනය කර නොමැත	ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	මෙතෙක් සම්පාදනය කර නොමැත	ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලවේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	වාර්ෂික කාර්ය සාධක ගිවිසුම අත්සන් කොට නොමැත	අත්සන් කිරීමට නියමිතය
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිපුණතා සංවර්ධන	අනුකූලවේ		

	වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම			
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින්පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම.	අනුකූලවේ.		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. ඩී්එන්/බී/ඩීසිජී/2022/02/03

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව.

ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යථෝක්ත වාර්තාව සහ සහතික කළ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

ජේ.සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත් :- 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

2. ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } DEF/B/DCG/02/2022/03 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අග්‍රිම ශේෂය

දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ දැක්වෙන සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයට පියවූ රු. 22,991,500 ක මුදල ACA – 03 අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශයේ මුදල් මඟින් අග්‍රිම පියවීමක් ලෙස දක්වා නොතිබුණි. එමෙන්ම භාණ්ඩාගාරයේ ශේෂ පිරික්සුමට අනුව වියදම් මඟින් අග්‍රිම පියවීම් වටිනාකම රු. 318,812,087 ක් වුවද මුදල් මඟින් පියවූ වටිනාකමද වියදම් මඟින් පියවීමක් ලෙස දක්වා තිබීමෙන් අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශය වන ACA – 03 ආකෘතිය ප්‍රකාරව එම වටිනාකම රු. 341,803,586 ක් විය. ඒ අනුව එම ශේෂයන් අතර රු. 22,991,500 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ දී ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් පරිත්‍යාග කර තිබූ නෞකාවක සහ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) පරිත්‍යාග කර තිබුණු යාත්‍රාවක දළ වටිනාකම රු.73,981,670 ක් ලෙස තක්සේරු කර තිබුණද එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණු අතර එය හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයතුළ දී ඔස්ට්‍රේලියානු වෙරළ ආරක්ෂක බලකාය විසින් පරිත්‍යාග කර තිබුණු රු.27,881,944 ක් වටිනා යන්ත්‍රෝපකරණ මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණු අතර එය හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නීරීක්ෂණයන් කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ ඉන්ධන සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. 2,400,000 ක් වූ අතර තත්‍යය මුළු වියදම රු. 582,759,746 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුවට වඩා ඉන්ධන වියදම රු. 580,359,746 ක් එනම් සියයට 24,180 කින් වැඩි වී තිබූ අතර දෙපාර්තමේන්තුවේ අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. ඇස්තමේන්තු ප්‍රමාණවත් නොවීම මත අතිරේක ඉන්ධන ප්‍රතිපූර්ණය කර ගැනීමකින් තොරව නාවික හමුදාවෙන් ලබා ගන්නා බවද නිරීක්ෂණය විය.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීරීක්ෂණයන් කරනු ලැබේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත	
(i) III වන කොටසේ 11 වගන්තිය	නිල බලයෙන් පත්වන සාමාජිකයින් 09 දෙනෙකුගෙන් යුතු උපදේශක සභාවක් ස්ථාපිත කළ යුතු වුවද, මේ දක්වාම එම සභාව ස්ථාපිත කර නොතිබුණි.
(ii) III වන කොටසේ 12 වන වගන්තිය	උපදේශක සභාව විසින් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කටයුතු පිළිබඳ සමාලෝචනයක් සිදුකර අමාත්‍යාවරයා වෙත ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීමට ද, දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කල යුතු ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍යාවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ ආරක්ෂක විෂය භාර අමාත්‍යාවරයාට යම් කරුණක් පිළිබඳව උපදෙස් ලබාදීමට ද උපදේශක සභාව ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් නොහැකි වී තිබුණි.

තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), 4.2.2 (අ) හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 04 ඡේදයේ මාර්ගෝපදේශ අංක 13

ප්‍රසම්පාදනය ආරම්භක අවස්ථාවේ සිට අවසාන අවස්ථාව දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් තහනම් මත්ද්‍රව්‍ය ප්‍රවාහනයේ යෙදුණු බෝට්ටු යාත්‍රා ද ඇතුළුව නාවික යාත්‍රා 07 ක් අත්අඩංගුවට ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 14 කදී අත්අඩංගුවට ගෙන තිබුණු තහනම් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 330 ක් හා මත්පෙති 1300 ක් ශ්‍රී ලංකා පොලීසිය වෙත භාරදී තිබුණි. එසේ අත්අඩංගුවට ගන්නා ලද තහනම් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 127 ක සහ මත්පෙතිවල වටිනාකම රු.677,770 කට තක්සේරු කර තිබුණද, අවස්ථා 02 කදී අත්අඩංගුවට ගන්නා ලද ග්‍රෑම් 203 ක් වූ තහනම් මත්ද්‍රව්‍යවල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

වටිනාකම රු.283,829,893 ක්වූ නෞකා හා යාත්‍රා 07 ක් මාස 03 ක සිට අවුරුදු 3 ක් දක්වාවූ කාලයක සිට අක්‍රීයව පැවතුණද, ප්‍රතිපාදන නොපැවතීම මත ඒවා අළුත්වැඩියා කර සේවයේ යෙදවීමට කටයුතු කර නොතිබුණි.

ජේ.සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට